# මාධ්‍ය නිවේදනය
## කාර්මික නිෂ්පාදන දර්ශකය : 2019 ජුනි
### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**දුරකථනය: 011 – 2147401** **ෆැක්ස්: 011-2147412** **2019 අගෝස්තු 09**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 ජුනි මාසය සඳහා කාර්මික නිෂ්පාදන දර්ශකය නිල වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2018 වර්ෂයේ ජුනි මස නිෂ්පාදනයට සාපේක්ෂව, 2019 ජුනි මස නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි, කාර්මික නිෂ්පාදන දර්ශකයේ 2.2% ක වැඩිවීමක් වාර්තා වේ. තව ද 2019 සහ 2018 යන වර්ෂවල ජුනි මස මෙම දර්ශකය පිළිවෙලින් 107.3 ක් සහ 105.0 ක් විය.

කාර්මික නිෂ්පාදන දර්ශකය ද ඇතුළත්ව ආර්ථික දර්ශකාංක ගණනාවක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලැබේ. කාර්මික නිෂ්පාදන දර්ශකය ආර්ථික වර්ධනය මෙහෙයවන ප්‍රධාන අංශ හඳුනා ගැනීමේදී හා ආර්ථික ක්‍රියාකාරිත්වය ඇගයීමේදී වැදගත් වන මිණුමක් වේ. මෙම දර්ශකය නිෂ්පාදන කර්මාන්තයන්හි නිෂ්පාදන ප්‍රමාණය පාදක කර ගනිමින් සකසා ඇත.

2018 ජුනි මස මාසික නිෂ්පාදන ධාරිතාවයට සාපේක්ෂව 2019 ජුනි මස 'කඩදාසි හා කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදනය', 'අඟුරු නිෂ්පාදනය හා ඛණිජ තෙල් ද්‍රව්‍ය පිරිපහදුව ', සහ 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය', වල පිළිවෙලින් 42.7%, 22.3% සහ 19.9% ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වේ.

එසේ වුවත්, 'වෙනත් නිෂ්පාදන' (මෝටර් රථ හා ට්‍රේලර් නිෂ්පාදන, වෙනත් ගමනාගමන උපකරණ නිෂ්පාදනය, ආභරණ නිෂ්පාදන) , 'පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනය' සහ 'මුද්‍රණය සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදනය' වල 2018 වර්ෂයේ ජුනි මස නිෂ්පාදනයට සාපේක්ෂව පිළිවෙලින් 36.6%, 24.6% සහ 23.4% ක අඩුවීමක් වාර්තා විය. තව ද, 2018 ජුනි මාසයට සාපේක්ෂව 2019 ජුනි මාසයේ දී ආහාර නිෂ්පාදන අංශයෙහි නිෂ්පාදනය ද 0.1% ක අඩුවීමක් වාර්තා කරයි.

කාර්තුමය වශයෙන් සැලකූ විට 2019 වර්ෂයේ දෙවන කාර්තුව තුළ නිෂ්පාදන කාර්මාන්ත අංශයෙහි නිෂ්පාදන ධාරිතාවය 0.6 % කින් වර්ධනය වී ඇත.

**කාර්මික නිෂ්පාදන දර්ශකය**
**(2015=100)**

| වර්ෂය / මාසය | දර්ශක අගය |
|---|---|
| 2019 - ජුනි | 107.3 |
| 2018 - ජුනි | 105.0 |
| | |
| 2018 ජුනි මසට සාපේක්ෂව ප්‍රතිශතක වෙනස (%) : 2.2 | |
| | |
| 2019 දෙවන කාර්තුව : 103.4 | |

2019 ජුනි මස කාර්මික නිෂ්පාදන දර්ශකය පිළිබඳව වැඩි විස්තර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර ඇත. ( www.statistics.gov.lk/Industries)

# Department of Census and Statistics

## Index of Industrial Production (IIP) - 2019

(2015 = 100)

**107.3**

**June**

IIP is an index which measures short term trends in the volume of Industrial Production

**2.2%**

Year on Year change (2019 June - 2018 June)

Significant changes by sector June 2019







| ISIC 2digit | Description | 2018 June$^R$ | 2019 June$^P$ | Year on Year (%) Change June 2019/ June 2018 |
|---|---|---|---|---|
| 10 | Food products | 102.7 | 102.5 | -0.1 |
| 11 | Beverages | 104.6 | 102.8 | -1.7 |
| 12 | Tobacco products | 93.1 | 83.3 | -10.5 |
| 13 | Manufacture of Textiles | 124.3 | 116.1 | -6.7 |
| 14 | Manufacture of wearing Apparels | 113.6 | 116.8 | 2.8 |
| 15 | Manufacture of leather and related products | 106.7 | 119.3 | 11.7 |
| 16 | Manufacture of wood and products of wood and cork except furniture; manufacture of articles of Straw and plaiting materials | 113.2 | 114.0 | 0.7 |
| 17 | Manufacture of paper and paper products | 79.0 | 112.7 | 42.7 |
| 18 | Printing and reproduction of recorded media | 113.9 | 87.3 | -23.4 |
| 19 | Manufacture of coke (coal) and refined petroleum products | 92.7 | 113.4 | 22.3 |
| 20 | Manufacture of chemicals & chemical products | 89.0 | 100.6 | 13.1 |
| 21 | Manufacture of basic pharmaceutical products and pharmaceutical preparations | 98.1 | 97.1 | -1.1 |
| 22 | Manufacture of rubber & plastic products | 116.8 | 94.0 | -19.5 |
| 23 | Manufacture of other non-metallic mineral products | 104.7 | 122.9 | 17.3 |
| 24 | Manufacture of basic metals | 124.8 | 130.2 | 4.4 |
| 25 | Manufacture of fabricated metal products ( except machinery equipment ) | 126.9 | 95.8 | -24.6 |
| 26-27 | Manufacture of electrical equipment | 79.2 | 87.2 | 10.2 |
| 28 | Manufacture of Machinery & equipment (n.e.c.) | 100.8 | 94.7 | -6.1 |
| 31 | Manufacture of furniture | 73.4 | 88.0 | 19.9 |
| 29-30-32-33 | Other manufacturing | 97.1 | 61.6 | -36.6 |
| | **Overall Index for the Manufacturing Sector** | **105.0** | **107.3** | **2.2** |

Table 01 : IIP of June of 2019 & 2018 and Year on Year changes (2015=100)

P-Provisional; R-Revised


Director General
Department of Census and Statistics
Contact No. 0112147001